*ශ්‍රී ලංකාව ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානය රැස්වෙන අවස්ථාවේ දී පවා, රටේ මානව හිමිකම් උල්ලංඝණ දෛනික මට්ටමකින් සිදුවෙයි.*

3 වන පිටෙන්

තිබේ. ලෝකයේ කෙටි ඉතිහාසයි නැමති සිය ග්‍රන්ථයේ එච්. ජී. වේල්ස් මෙසේ ලියයි

"ලෝක ඉතිහාසයේ දසදහස් ගණන් වන කුළුණු මධ්‍යයේ අශෝකගේ නාමය විරාජමානයී එය තරුවකි."

එවැනි වික්‍රමයක් අත්කර ගත් අවස්ථාවක් ඉතිහාසයේ තවත් නැත. ඉතිං, අපේම මහින්ද රාජපක්ෂගෙන් එවැන්නක් අපේක්ෂා කරන්නට නම් කෙනෙකු පිස්සෙකු විය යුතුය. එහෙත් අනිත් අතට, ත්‍රස්තවාදයට එරෙහි තිස් අවුරුදු යුද්ධයෙන් ලද ජයග්‍රහණය හරහා තිරසාර සංහිඳියාවක් සහ එක්සත් භාවයක් ගොඩනගමින්, ජනතාව සඳහා වන කාර්යක්ෂම පරිපාලනයක් සහ සමෘද්ධියක් ජනතාවට අත්කර දෙන ආණ්ඩුකරණ මාදිලියක් මහින්ද රාජපක්ෂට ස්ථාපිත කළ හැකිව තිබිණැ යි සිතා ගැනීමට කෙනෙකුට බැරි කමක් නැත. එසේ කිරීමට මහින්ද රාජපක්ෂ අසමත් වීම නිසා එම ජයග්‍රහණය මහා පුස්සක් බවට පත්ව, යුදකාමී බෙදුම්වාදයකට නැවත අත වැනීමකට ළංවුණි.

බලගතු මතයක්, තිරශ්චීන බලයෙන්ම නසාලීමට පුලුවන් කමක් කෙනෙකුට නැත. එය, දැගරයක් සේ, සමහර විට වඩාත් බිහිසුණු අන්දමින්, නැවත පොලා පනී. එම මතය නිෂ්ක්‍රීය කළ හැක්කේ සහ එහි අදාළත්වය අහෝසි කළ හැක්කේ, අව්‍යාජ සමගි ක්‍රියාදාමයකින් පමණි. ආධ්‍යාත්මික සහ බුද්ධිමය විභවයක් අශෝකට තිබුණි. මහින්දට එවැන්නක් නැත. වෙනස එයයි.



එවැනි ආධ්‍යාමිකතාවක කළලයක්වත් මහින්ද රාජපක්ෂට නොපැවති බව, ජයග්‍රහණය උත්කර්ෂයට නැංවීමට ඔහු ගත් තීරණයෙන්ම පෙන්නුම් කෙරුණි. සිදුවූ විනාශය ගැන අශෝක රජු බලවත් ශෝකයට පත්විය. මහින්ද රජුට අංශුමාත්‍රයක් හෝ එවැනි ශෝකයක නොවුණි. ඔහු කාහල නාදය පිම්බේය. රටේ අනාගතය තකා තමන් එවැන්නක් නොකළ යුතු බවට මෙලෝ වැටහීමක් නැතිව තවමත් ඒ කාහල නාදය ඔහු පතුරුවයි. ඔහුගේ පාලන කාලය තුළ ජාතික සංහිඳියාවක් අත්කර ගත නොහැකි බවට එය සාක්ෂියකි. එවැන්නක් සඳහා අද ආණ්ඩු වෙනසක් අවශ්‍ය කෙරේ.

පාලන තන්ත්‍රය අසමත්ව ඇත්තේ රට එක්සත් කිරීමට පමණක් නොව. අන්තවාදී වාගාලාප මගින් වෙනත් භයානක වාර්ගික අගතීන් උග්‍ර කොට රටේ ජාතික එක්සත් භාවය කබලෙන් ලිපට හෙළීමටත් ආණ්ඩුව මුල් වී තිබේ. මේ දක්වා අප දැක නොතිබුණු බෞද්ධ භික්ෂූන්ගේ අශෝභන කලහකාරීත්වයකට අයාලේ යාමට ඉඩ හැර ආණ්ඩුව අහක බලාගෙන සිටීමෙන් පෙනෙන්නේ, එය ඔවුන්ගේ අනුදැනුමෙන් සිදුවන්නක් බවයි. තමන් පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී විවේචනයක යෙදෙන්නන්ට පවා කිසි සමාවක් නොදෙන ආණ්ඩුවක්, මේ පිරිස ගැන එසේ ඉවසීමෙන් සිටීම, එවැනි අන්තවාදී සහ අවිචාරවත් කොටස් පසුපසින් ආණ්ඩුව සිටින බවට කෙනෙකු තුළ සාධාරණ සැක උපදවන්නකි. ඒ නිසාම, ජාතික සමගිය සහ එක්සත් භාවය කෙරෙහි නියුක්ත වීමට මේ ආණ්ඩුවට හැකියාවක් නැති බව ඔප්පු කෙරේ.

ඇහැකන පෙනෙන ශ්‍රී ලාංකිකයන් අද දකින්නේ, කාලිංග අත්දැකීමේ ප්‍රතිපක්ෂ ගමන් පථයකි. ලැබූ ජයග්‍රහණය, තමන්ගේ බල පදනම වඩාත් ව්‍යාප්ත කර ගැනීමටත්, සුරක්ෂිත කර ගැනීමටත් පාවිච්චි කිරීම සුරුවිරු කමකි යි ආණ්ඩුව සිතුවේය. එහි මුල් පියවර වුණේ, සරත් ෆොන්සේකාව දර්ශනයෙන් ඉවත් කිරීමයි. වෙනත් පාර්ශ්වකරුවන් සමග ජයග්‍රහණය බෙදාහදා ගැනීමට ආණ්ඩුවට අවශ්‍ය නොවුණි. ඊළඟ පියවර වුණේ, 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමයි. ඊළඟට, 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමයි. එයින් ද නොනැවතුණු ආණ්ඩුව, ඉතා විවාදාපන්න ආකාරයකින් අගවිනිසුරුවරියවත් පන්නා ගත්තේය. එහි දී එල්ල වූ විවේචන හෝ වෙනත් අදහස් උදහස් ගැන කිසි තැකීමක් ආණ්ඩුවේ ඇත්තන්ට නොවුණි.

එවැනි දඬු අඬු සියල්ල සකසා ගැනීමෙන් පසු, ආණ්ඩුව දැන් ක්‍රියා කරන්නේ, කිසිවකට යටත් නැති, හිතුමතේ ඕනෑම දෙයක් කළ හැකි රටාවකිනි. ශ්‍රී ලංකාව ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානය රැස්වෙන අවස්ථාවේ දී පවා, රටේ මානව හිමිකම් උල්ලංඝණයන් දෛනික මට්ටමකින් සිදුවෙයි. දැවැන්ත ප්‍රාග්ධන ව්‍යාපෘති, කිසි පාරදෘෂ්‍ය භාවයකින් තොරව ක්‍රියාත්මක කෙරේ. මහාමාර්ග ව්‍යාපෘතිවලින් රටට යම් සෙතක් ඇතත්, වෙනත් ව්‍යාපෘති බොහොමයක් සුදු අලින් ය. ආණ්ඩුවේ දූෂිත දේශපාලඥයන් කොන්ත්‍රාත්කරුවන්ට ලෝහ, වැලි ආදිය සැපයීමේ ක්‍රියාවලියක් තුළ, පර්යන්ත සැපයුම් අංශයේදී දූෂණය බෙදී යන සැටි, දිවයින පුවත්පත පසුගිය දවසක වාර්තා කොට තිබුණි. මේ දේශපාලඥයන්ගේ බිය ගැන්වීම්වලට යටත්ව කොන්ත්‍රාත්කරුවන්ට වැඩ කිරීමට සිදුව ඇති සැටි පැහැදිලි කර තිබුණු එම වාර්තාව, බල තන්ත්‍රයේ ඉහළ සිට පහළට ජරාව කෑම මනාව විස්තර කොට තිබුණි. මේ දූෂණය පිළිබඳ සාධකයත් සමස්ත වියදමට ඇතුළත් වන හෙයින්, ඒ සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ මහජනතාවට අසීමිත බරක් පටවමිනි. මේ සැපයුම් වළල්ල තුළ කූට ජාවාරමට ඉඩ දී තිබීම හරහා, අවශ්‍ය වූ විටෙක සහාය ලබාගත හැකි දේශපාලනික ආධාරකරුවන් නඩයක් ද ආණ්ඩුව සපයා ගන්නේ යැයි මම අනුමාන කරමි.

දැවැන්ත කැබිනට් මණ්ඩලයේ බොහොමයක් දෙනා මොනම කාර්යශූරත්වයක්වත් ඇත්තන් නොවේ. අමාත්‍යාංශ තුළ මොනම ප්‍රතිපත්ති සංවර්ධනයක්වත් සිදුවන්නේ නැත. දූෂණය ආයතනගත කෙරී ඇති අතර අපචාර එමටයි. මහා මත්ද්‍රව්‍ය ජාවාරමකට අගමැතිවරයාගේ කාර්යාලය පවා සම්බන්ධ වී ඇත. ඒවා සියල්ල දැන් යට ගසා තිබේ.

ඩයස්පෝරා ශ්‍රී ලාංකිකයන් වන අපි ශ්‍රී ලංකාවෙන් එන බොහෝ ටෙලි නාට්‍ය නරඹමු. තණ්හාධික බව, දූෂණය සහ නග්න අවස්ථාවාදය එම චරිත තුළ නිතර නිරූපණය කෙරේ. කිසිවෙකු විශ්වාස කළ නොහැක. අවංක මිනිසා හැම විටකම මෝඩයෙකු වෙයි. අධ්‍යාපනය හෑල්ලු කෙරෙයි. මේ වින්දන කලාවන්ගෙන් නිරූපණය කෙරෙන්නේ සමාජ වටිනාකම් වන හෙයින්, ශ්‍රී ලංකාවේ සමාජය පරිවර්තනය වෙමින් ඇති සැටි මේ හරහා නියෝජනය වන්නේ යැයි කෙනෙකුට සිතාගත හැකිය. පැහැදිලිවම, ඉච්ඡා භංගත්වයක හෝ සම්මත විරෝධී භාවයකට අපේ සමාජය යට වෙමින් සිටින බව පෙනෙන්ට තිබේ.

ඒ අයුරින්, ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආණ්ඩුවට, ඒ මහා කාලිංග නිමේෂය අතහැරී ඇත. මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියට ලංකාවේ ආණ්ඩුව කුදලාගෙන යනු ලැබීම, එය සංකේතවත් කරයි. ඒ වූ කලී, ඓතිහාසික කාලිංග නිමේෂයේ සපුරා ප්‍රතිපක්ෂයයි.

අප වැනි යටහත් පහත් පුරවැසියන්ට කළ හැක්කේ, සිදුවිය හැකිව තිබූ දෑ ගැන මෙසේ ආවර්ජනා කිරීම පමණි.

## සන්නස Cartoon by PK




විස්සයි 20 තරග රටාවේ
සුපිරි වීරයන් දෙදෙනා

# සංගා - මහේල

ඔබට සුබ පැතුම්







**සියලුම ජෝතිෂ්‍ය කටයුතු**

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මළවර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දළ, සිරිපති, ත්‍රිශ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිෂ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au